## සිව් වැනි කොටස

## මහ බැංකුවේ හා ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ

## 1984 ප්‍රධාන නීති අනපනත්


| | | පිටුව |
|---|---|---|
| 1. | 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාරය පනත ... ... | I |
| 2. | 1984 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත ... | VI |
| 3. | 1984 අංක 19 දරන මුදල් (සංශෝධන) පනත ... ... | XIX |
| 4. | 1984 අංක 29 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත | XXIX |
| 5. | 1984 අංක 33 දරන විදේශීය ණය (සංශෝධන) පනත ... | XXV |
| 6. | 1984 අංක 46 දරන විසර්ජන පනත ... | XXVI |
| 7. | 1984 අංක 47 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත ... | XXIX |

# 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාරය පනත

**[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 11 වන දින.]**

**1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අය කරනු ලැබීමට යටත් වන සෑම තැනැත්තකු විසින්ම ගෙවිය යුතු ආදායම් බද්දට යොමු කිරීමෙන්, ඒ තැනැත්තා විෂයයෙහි අධිභාරයක් නියම කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාරය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මේ පනතෙහි "අදාළ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් වන සෑම තැනැත්තකුම, වෙනත් යම් ලිඛිත නීතියක නැතහොත් යම් සම්මුතියක, ප්‍රදානයක හෝ ගිවිසුමක කුමක් සඳහන්ව ඇත ද, ඒ ආදායම් බද්දෙන් සියයට දහයක අනු ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ, අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද මත අධිභාරයක් ගෙවීමට යටත් විය යුතුය.

**3.** මේ පනත යටතේ අධිභාරය ගෙවීමට යටත් සෑම තැනැත්තකුම, ඔහු වෙත තක්සේරුවක් නිකුත් කර නොමැති වුව ද, ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ මුදලින් සියයට පනහකට නොඅඩු මුදලක් **1984 ජූලි මස 15** වන දින හෝ එදිනට පෙර ද, ශේෂය 1984 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ද, කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතුය.

**4.** දේශීය ආදායම් පනතේ XV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව, අදාළ වර්ෂය සඳහා ආදායම් බදු අඩු කරනු ලැබිය යුත්තේ (ඒ පනතේ 67 වන වගන්තියේ (7) වන උප වගන්තියෙන් නිර්වාසිකයෙකු ලෙස සලකනු ලබන සේවා නියුක්තයකු නොවන) යම් සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමිකයෙන් ද ඒ සේවා නියුක්තයා සේවයෙහි නියුක්ත කරනු ලබන සෑම සේවා යෝජකයකු විසින්, 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව, 1985 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන සෑම මාසයක් සඳහාම, මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද මත වූ අධිභාරය ලෙස, ආදායම් බද්ද වශයෙන් අඩු කරන ලද මුදලින් සියයට දහයක් ද අඩු කරනු ලැබිය යුතුය.

**5.** යම් තැනැත්තකු විසින්—

(අ) අදාළ වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දේ ;

(ආ) අදාළ වර්ෂය සඳහා ගෙවිය යුතු ධන බද්දේ ; සහ

(ඇ) මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද මත වූ අධි භාරයේ

එකතුව ඒ වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ සහ (වාසස්ථානයක වාර්ෂික ශුද්ධ වටිනාකම සහ දේශීය ආදායම් පනත යටතේ වූ ආදායම් බද්දෙන් නිදහස් යම් සහනාධාරයක් නොවන) ඒ පනත යටතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් ලාභ සහ ආදායම වන, එහෙත් ඒ නිදහස් කිරීම නිසා නොවේ නම් අදාළ වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ආගණනය කිරීමේ දී ගණන් ගනු ලැබිය යුතු වූ ද යම් ලාභවල සහ ආදායමේ එකතුවෙන් සියයට අසූවක් ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්ත මුදල ආදායම් බද්ද මත වූ ඒ අධිභාරයට ප්‍රතිපක්ෂව හිලව් කරනු ලැබිය යුතුය.

**6.** (1) අධිභාරයේ යම් වාරිකයක් ගෙවීම සඳහා 3 වන වගන්තියෙහි සඳහන් දිනවලදී හෝ ඒ දිනවලට පෙර ඒ වාරිකය හෝ ඒ වාරිකයේ කොටසක් හෝ ගෙවා නොමැති අවස්ථාවක, අධිභාරයේ ඒ වාරිකය හෝ එහි කොටස පැහැර හැර ඇතැයි සලකනු ලැබිය යුතු අතර—

(අ) ඒ අධිභාරය එක් තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු අවස්ථාවක, ඒ තැනැත්තා; සහ

(ආ) ඒ අධිභාරය එක් තැනැත්තකුට වැඩි ගණනක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවනු ලැබිය යුතු අවස්ථාවක, ඒ එක් එක් තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු

මේ පනතේ කාර්ය සඳහා පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් අධිභාරයක් පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක පැහැර හරින්නා විසින්, පැහැර හැර ඇති අධිභාරයට අතිරේකව—

(අ) පැහැර හැර ඇති මුදල් ප්‍රමාණයෙන් සියයට පහකට සමාන මුදලක්, සහ

(ආ) පැහැර හරිනු ලැබීම පටන් ගැනීමෙන් පසුව දින තිහක් ඉකුත්වීමට පෙර, පැහැර හරිනු ලැබ ඇති යම් මුදල් ප්‍රමාණයක් ගෙවා නොමැති අවස්ථාවක, එය පැහැර හරිනු ලැබ ඇති මාස තුනක එක් එක් වැඩිපුර කාලසීමාව හෝ ඒ කාලසීමාවේ කොටසක් හෝ සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබ ඇති මුදල් ප්‍රමාණයෙන් සියයට පහකට සමාන වැඩි පුර මුදලක්

දණ්ඩනයක් වශයෙන් ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද—

(i) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු මුළු මුදල පැහැර හරිනු ලැබ ඇති අධිභාරයෙන් සියයට පනහක්, කිසිම අවස්ථාවක, නොඉක්මවිය යුතු ය ;

(ii) දේශීය ආදායම් පනත යටතේ 1983 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සියයට පහකට නොඅඩු මුදලක්, පිළිවෙලින් 1984 ජූලි මස 15 වැනි දින හෝ එදිනට පෙර සහ 1984 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර අධිභාරයක් වශයෙන් ඔහු විසින් ගෙවනු ලැබ ඇති අවස්ථාවක, ඔහු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණයට වැඩියෙන් 3 වන වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණයේ යම් අතිරික්තයක් 1985 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවනු ලැබුවහොත්, 3 වන වගන්තිය යටතේ ඔහු විසින් කරනු ලැබීමට නියමිත ගෙවීම සම්බන්ධයෙන් යම් දණ්ඩනයකට ඔහු යටත් නොවිය යුතු ය ;

(iii) සියලු අවස්ථානුගත කරුණු අනුව යම් අඩු කිරීමක් හෝ අත්හැරීමක් කිරීම යුක්ති සහගත යයි හා සාධාරණ යයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම්, මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කරනු ලැබිය හැකි ය, නැතහොත් අත් හරිනු ලැබිය හැකි ය.

**7.** දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දට අදාළ වාරවාර්තා සැපයීම, ආදායම් බද්ද අඩුකිරීම, ඒ බද්ද තක්සේරු කිරීම, තක්සේරු කිරීමට විරුද්ධව කරනු ලබන අභියාචන, ඒ බද්ද ගෙවීම, අයකර ගැනීම සහ ආපසු ගෙවීම සම්බන්ධයෙන් දේශීය ආදායම් පනතේ XIII වන පරිච්ඡේදයේ සහ XV වන පරිච්ඡේදයේ සිට XXVI වන පරිච්ඡේදය තෙක් වූ පරිච්ඡේදවල විධිවිධාන, මේ පනත යටතේ ගෙවිය යුතු අධිභාරයට අදාළ වාර වාර්තා සැපයීම සහ ඒ අධිභාරය අඩුකිරීම, තක්සේරු කිරීම, තක්සේරු කිරීමට විරුද්ධව කරනු ලබන අභියාචන, ඒ අධිභාරය ගෙවීම, අයකර ගැනීම සහ ආපසු ගෙවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන සුළු වශයෙන් වූ වෙනස් කිරීම්වලට යටත්ව අදාළ විය යුතු ය :—

(අ) දේශීය ආදායම් පනතේ 92(1) වන වගන්තිය යටතේ අදාළ වර්ෂය සඳහා ස්වකීය ආදායම පිළිබඳව වාරවාර්තාවක් යම් තැනැත්තකු විසින් සපයනු ලැබුවහොත්, ඒ වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද පිළිබඳ වාරවාර්තාවක් සැපයීමට ඒ තැනැත්තා වෙත මේ පනතින් පනවන ලද නියමය අනුව ප්‍රමාණවත් ලෙස කටයුතු කර ඇතැයි සලකනු ලැබිය යුතුය ;

(ආ) දේශීය ආදායම් පනත යටතේ අදාළ වර්ෂය සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද සම්බන්ධයෙන් ඒ තැනැත්තා මත තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් හෝ තක්සේරුකරුවකු විසින් කරනු ලබන අවස්ථාවක, ඒ තක්සේරු-කරු විසින්, ඒ අවස්ථාවේදීම සහ එම ආකෘතියෙහිම මේ පනත යටතේ ඒ වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු අධිභාරය සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි,තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලැබිය හැකි ය. අවස්ථාවෝ-චිත පරිදි, ඒ තක්සේරු කිරීම් හෝ අතිරේක තක්සේරු කිරීම් ඒ ඒ පනත් යටතේ නිකුත් කරන ලද වෙන වෙනම වූ තක්සේරු කිරීම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) අදාළ වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ යම් තැනැත්තකු මත අය කරන ලද ආදායම් බද්දේ ප්‍රමාණය සඳහන් කරමින් දේශීය ආදායම් පනතේ 116 වන වගන්තිය යටතේ ඒ තැනැත්තාට තක්සේරු කිරීමේ දැන්වීමක් දෙනු ලබන අවස්ථාවක, ඒ වර්ෂය සඳහා මේ පනත යටතේ ඒ තැනැත්තා මත අය කරන ලද අධිභාරයේ මුදල් ද ඒ දැන්වීමෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය. ඒ දැන්වීම් ඒ ඒ පනත් යටතේ නිකුත් කරන ලද වෙන වෙනම වූ දැන්වීම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඈ) අදාළ වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද සම්බන්ධ-යෙන් වූ තක්සේරුවට විරුද්ධව අභියාචනයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ අභියාචනයට මේ පනත යටතේ ඒ වර්ෂය සඳහා ගෙවිය යුතු අධිභාරයට විරුද්ධව කරන ලද අභියාචනයක් ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අභියාචනය ඒ අනුව තීරණය කරනු ලැබිය යුතු ය ; තවද

(ඉ) දේශීය ආදායම් පනතේ XXI වන පරිච්ඡේදය යටතේ යම් තැනැත්තකුට දැන්වීමක්, ප්‍රකාශයක් හෝ සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ දැන්වීමෙහි, ප්‍රකාශයෙහි හෝ සහතිකයෙහි, මේ පනත යටතේ පැහැර හැර ඇති යම් අධිභාරයක් සම්බන්ධයෙන් විස්තර ද ඇතුළත් කරනු ලැබිය හැකි ය. අවස්-ථාවෝචිත පරිදි එම දැන්වීම්, ප්‍රකාශ හෝ සහතික ඒ ඒ පනත් යටතේ නිකුත් කරන ලද වෙන වෙනම වූ දැන්වීම්, ප්‍රකාශ හෝ සහතික ලෙස සලකනු ලැබිය යුතු ය.

**8.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

''ඝක්සේරු කළ හැකි ආදායම'', ''කොමසාරිස් ජනරාල්වරයා'', ''නිර්වාසික සමාගම'', ''තැනැත්තා'', ''ලාභ සහ ආදායම'', ''වාසික සමාගම'' සහ ''තක්සේරු වර්ෂය'' යන යෙදුම්වල දේශීය ආදායම් පනතෙහි පිළිවෙලින් ඒවාට වෙන්කොට දී ඇති අර්ථයන්ම ඇත්තේ ය ;

''සේවා යෝජක '', ''සේවා නියුක්තයා'' හා පාරිශ්‍රමිකය'' යන යෙදුම්වල දේශීය ආදායම් පනතේ XV වන පරිච්ඡේදයෙහි පිළිවෙලින් ඒවාට වෙන් කොට දී ඇති අර්ථයන්ම ඇත්තේ ය ;

යම් තැනැත්තකු සහ අදාළ වර්ෂය සම්බන්ධයෙන් ''ආදායම් බද්ද'' යන්නෙන්—

(අ) 2 වන වගන්තියෙහි සහ—

(i) වාසික සමාගමක් සම්බන්ධයෙන් වන විට, දේශීය ආදායම් පනතේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අදාළ වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු යම් ආදායම් බද්දක් අඩු කොට ඒ වර්ෂය සඳහා ඒ සමාගම විසින් ඒ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ ;

(ii) නිර්වාසික සමාගමක් සම්බන්ධයෙන් වන විට, දේශීය ආදායම් පනතේ 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනු-ඡේදය හෝ (ii) වන අනුඡේදය යටතේ අදාළ වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු යම් ආදායම් බද්දක් අඩු කොට ඒ වර්ෂය සඳහා ඒ සමාගම විසින් ඒ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ ;

(iii) දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් සේවා නියුක්තියෙන් ලැබුණු යම් ලාභ, අදාළ වර්ෂය සඳහා වූ ලාභ සහ ආදාය-මෙහි ඇතුළත් වන්නා වූ යම් වාසික පුද්ගලයෙකු සම්බන්ධයෙන් වන විට, සේවා නියුක්තියෙන් ලැබුණු ඒ ලාභ, අදාළ වර්ෂය සඳහා වූ ස්වකීය ලාභ සහ ආදායමේ කොටසක් නොවූයේ නම්, ඒ පුද්ගලයා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු වූ යම් ආදායම් බද්දක් අදහස් වේ ;

(iv) දේශීය ආදායම් පනතේ 67 වන වගන්තියේ (7) වන උපවගන්තියෙන් නිර්වාසිකයකු ලෙස සලකනු ලබන පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, අදාළ වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියෙන් ඔහු ලැබූ ලාභ ඒ වර්ෂය සඳහා ඔහුගේ ලාභ සහ ආදායමේ කොටසක් නොවූයේ නම්, ඒ පුද්ගලයා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු වූ යම් ආදායම් බද්දක් අදහස් වේ ; සහ

(v) වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, අදාළ වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ ; තවද

(ආ) 5 වන වගන්තියෙහි ඒ වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ ;

''දේශීය ආදායම් පනත'' යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ.

# 1984 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 24 වන දින.]**

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1984 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් ඒ වගන්තිය නැවත අංක කිරීමෙන් ;

(2) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(ඇ) සේවායෝජක විසින් කුලියක් නොමැතිව සපයනු ලැබූ යම් වාසස්ථානයක කුලී වටිනාකම හෝ සේවා යෝජකයකු විසින් කුලී වටිනාකමට අඩු කුලියකට වාසස්ථානයක් සපයනු ලබන අවස්ථාවක, ඒ කුලිය ඉක්මවා ඇති කුලී වටිනාකමෙහි අතිරික්තය

ඇතුලත් වේ.

මේ ඡේදයේ කාර්ය සඳහා යම් වාසස්ථානයක කුලී වටිනාකම—

(i) 1983 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 5 වන වගන්තියෙහි අර්ථකථනය කොට ඇති ශුද්ධ වාර්ෂික වටිනාකමට අයිතිකරු විසින් ගෙවනු ලබන වරිපනම් හා අලුත්වැඩියා කිරීම් සහ වෙනත් වියදම් වෙනුවෙන් ඒ ශුද්ධ වාර්ෂික වටිනාකමට සියයට තිස්තුනයි තුනෙන් එකක් එකතු කළ විට ලැබෙන මුදල විය යුතු ය ; තවද

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

(අ) (i) වන විෂයට අනුකූලව ආගණනය කරන ලද මුදල ; හෝ

(ආ) ඒ වාසස්ථානය සඳහා ගෙවන ලද දළ ගෙවල් කුලිය

යන මේ ප්‍රමාණ දෙකින් වඩා වැඩි ප්‍රමාණය විය යුතු ය :

එසේ වුවද—

(i) 1983 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විස්තර කරන ලද ලාභවලින් සියයට පහළොවක් නැතහොත් රුපියල් පහළොස් දහසක් යන මේ ප්‍රමාණ දෙකින් වඩා අඩු ප්‍රමාණයට ; සහ

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විස්තර කරන ලද ලාභවලින් සියයට විසිපහක් හෝ රුපියල් හතලිස් අටදහසක් යන මේ ප්‍රමාණ දෙකින් වඩා අඩු ප්‍රමාණයට

වැඩි කුලී වටිනාකමේ යම් අතිරික්තයක් නොසලකා හැරිය යුතු ය; '' ; තවද

(3) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට පසු පහත දක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

'(2) මේ වගන්තියේ කාර්ය සඳහා, ''යම් ප්‍රතිලාභයක වටිනාකම'' යන්න එවැනි යම් ප්‍රතිලාභයක් ලැබුණ හෝ ව්‍යුත්පන්න වූ පුද්ගලයකු සම්බන්ධයෙන් යෙදෙන විට—

(අ) ඒ ප්‍රතිලාභයේ වෙළෙඳ වටිනාකම පහසුවෙන් නිසැකව දැනගනු ලැබිය හැකි අවස්ථාවක, ඒ වෙළෙඳ වටිනාකම ; සහ

(ආ) ඒ ප්‍රතිලාභයේ වෙළෙඳ වටිනාකම පහසුවෙන් නිසැකව දැනගනු ලැබිය නොහැකි හෝ ඒ ප්‍රතිලාභයෙහි වෙළෙඳ වටිනාකමක් නොමැති අවස්ථාවක, ඒ ප්‍රතිලාභය ලබා ගැනීමෙහි ලා වෙනත් යම් පුද්ගලයකු විසින් දරනු ලැබිය යුතු වූ වියදම

ඉන් අදහස් වේ :

එසේ වුවද, ඒ ප්‍රතිලාභයේ වෙළෙඳ වටිනාකම හෝ ඒ ප්‍රතිලාභය ලබා ගැනීමෙහි ලා වෙනත් යම් පුද්ගලයකු විසින් දරනු ලැබිය යුතු වූ වියදම කෙරෙහි සැලකිලිමත්ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් ප්‍රතිලාභයක් මත තබනු ලැබිය යුතු වටිනාකම නිශ්චය කරනු ලැබිය හැකි අතර, ප්‍රතිලාභයක් සම්බන්ධයෙන් වටිනාකමක් එසේ නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ වටිනාකම, ඒ ප්‍රතිලාභයේ වටිනාකම ලෙස සලකනු ලැබිය යුතුය.'.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඌ) ඡේදයෙහි ''කොළඹ ක්‍රමය කාර්යාංශය'' යන වචන වෙනුවට ''කොළඹ ක්‍රමය කාර්යාංශය හෝ ආසියානු සංවර්ධන බැංකුව '' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (ඉ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව, යම් තැනැත්තකු විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් යම් වාණිජ බැංකුවක විවෘත කරන ලද යම් ගිණුමක විදේශ ව්‍යවහාර මුදලින් ඔහුගේ බැරට ඇති මුදල් මත, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත සිටි කාලය තුළ සහ ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකාවේ පදිංචි කරුවකු වන දිනට ඉක්බිතිවම එළඹෙන අවුරුදු හය සඳහා ඒ තැනැත්තාට උපචිත වන පොලිය ;''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ආ) ඡේදයේ '' 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන '' යන වචන හා ඉලක්කම් වෙනුවට '' 17 වන, 17අ, 18 වන, 19 වන, 20 වන, 20අ, 21 වන'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (ඊ) ඡේදයෙහි ''අපනයන සංවර්ධන අරමුදලෙන්'' යන වචන වෙනුවට ''අපනයන සංවර්ධන අරමුදලෙන් ;'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

''(උ) වෙනත් යම් කෘෂිකාර්මික නිෂ්පාදිතයක් වගාකිරීම හෝ නැවත වගා කිරීම සඳහා වෙනත් යම් යෝජනා ක්‍රමයක් යටතේ''.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 17අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

''1983 නොවැම්බර් මස 17 වන දින හෝ ඉන්පසු ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලැබූ ඇතැම් සමාගම්වල ලාභ සහ ආදායම අවුරුදු පහක කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17අ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් ව්‍යවසායකින් යම් සමාගමක් 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම නොවන) ලාභ සහ ආදායම, අවුරුදු පහක කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු අතර, ඒ අවුරුදු පහක කාලය, ඒ ව්‍යවසාය ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කළ දින සිට ගණන් ගනු ලැබිය යුතු ය.

(2) 1983 නොවැම්බර් මස 17 වන දින හෝ ඉන් පසු ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කරනු ලැබූ —

(අ) මෙහි මින් මතු සඳහන් කරනු ලබන ව්‍යවසායයන් එකක් හෝ ඊට වැඩි ගණනක්, එනම්—

(i) පශු පාලනය සඳහා වූ ව්‍යවසායයක් ;

(ii) උක්ගස් වගාකිරීම සඳහා වූ ව්‍යවසායයක් ;

(iii) මුහුදේ හෝ රට ඇතුළත මසුන් ඇල්ලීම සඳහා වූ ව්‍යවසායයක් ;

(iv) ඉහතින් වූ අනුඡේද කිසිවක සඳහන් යම් ක්‍රියාකාරකමක් කරගෙන යාම සඳහා සහ ඒ ක්‍රියාකාරකමේ නිෂ්පාදිතය සැකසීම සඳහා වූ ව්‍යවසායයක් ;

(v) යම් වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා දිරිගැන්වීම් සැලසීමේ අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත් ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් වෙළෙඳ ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ යම් කෘෂිකාර්මික නිෂ්පාදනවලින් නිෂ්පාදනය කිරීම සඳහා වූ ව්‍යවසායයක්

කරගෙන යාමෙහි ලා පමණක් නිරතව ඇති සමාගමක් වන්නා වූ ද ;

(ආ) අපනයන නිෂ්පාදන ග්‍රාම සමාගමක් වන, සමාගමක් වන්නාවූ ද ;

ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් සමාගමකට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා ''අපනයන නිෂ්පාදන ග්‍රාම සමාගම'' යන්නෙන්—

(අ) 1982 අංක 17 දරන සමාගම් පනතේ අර්ථානුකූලව ජනතා සමාගමක් වන්නා වූ ;

(ආ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පනතින් පිහිටුවන ලද අපනයන සංවර්ධන මණ්ඩලය සහ ඒ සමාගම විසින් නිෂ්පාදනය කරන ලද යම් නිෂ්පාදිතවල නිෂ්පාදකයන් එහි කොටස් හිමියන් වන්නාවූ; සහ

(ඇ) සමාගම විසින් හෝ බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය කිරීම සම්බන්ධයෙන් නිරත වෙනත් යම් සමාගමක් මගින් හෝ එහි භාණ්ඩ අපනයනය කරනු ලබන්නා වූ සමාගමක් අදහස් වේ :

එසේ වුවද, 1983 නොවැම්බර් මස 17 වන දිනට පෙරාතුව ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කරනු ලැබූ ව්‍යවසායක් පවත්වාගෙන යන්නා වූ හෝ 1983 නොවැම්බර් මස 17 වන දිනට පෙරාතුව පැවති යම් ව්‍යාපාරයක් බෙදීමෙන් හෝ ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ පිහිටුවනු ලැබූ යම් සමාගමකට මේ වගන්තිය අදාළ නොවිය යුතු ය. ''.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 20අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

'1984 අප්‍රේල් මස 1 වන දින සිට 1989 මාර්තු මස 31 වන දින තෙක් ඇතැම් ව්‍යවසායවල අපනයන ලාභ සහ ආදායම් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

20අ. (1) යම් ව්‍යවසායක අපනයන ලාභ සහ ආදායම සමන්විත වන, (ඒ ව්‍යවසායේ ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායමේ ඒ කොටස, 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 1989 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) මේ වගන්තියේ —

''අපනයන ලාභ සහ ආදායම'' හා ''මුළු පිරිවැටුම'' යන්නෙහි 20 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි පිළිවෙළින් ඒවාට දී ඇති අර්ථයන් ම ඇත්තේ ය ;

''අපනයන පිරිවැටුම'' යන්න, ව්‍යවසායක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට—

(i) බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් ; හෝ

(ii) නැව් අළුත්වැඩියා කිරීම, නැව් කැඩීම, සමුද්‍රීය නැව් බඩු ඇහුරුම් බඳුන් අලුත්වැඩියා කිරීම හා නැවත සැපයීම, කොම්පියුටර් මෘදු භාණ්ඩ, කොම්පියුටර් වැඩ සටහන් සහ කොම්පියුටර් පද්ධති සැලසීම, කොම්පියුටර් දත්ත වාර්තාගත කිරීම වැනි සේවාවන් වන, විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා සේවාවන් ඉටු කිරීමෙන්

ඒ ව්‍යවසායට ලැබුණ හෝ ලැබිය යුතු මුළු මුදල ඉන් අදහස් වේ.

එහෙත්—

(අ) ප්‍රාග්ධන වත්කම විකිණීමෙන් ලැබුණ හෝ ලැබිය යුතු යම් මුදලක් ;

(ආ) මැණික් විකිණීමෙන් ලැබුණ හෝ ලැබිය යුතු යම් මුදලක් ;

(ඈ) තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ඔට්ටපාලු, පොල් තෙල්, කපාපු පොල්, කොප්පරා, ගෙඩි පොල් හෝ කොහු කෙඳි අපනයනය කිරීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක් ;

(ඇ) පේෂ කර්මාන්ත භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අපනයනය කිරීම සඳහා සලාකයක් වෙන්කොට දී ඇත්තේ යම් ඇඟලුම් අපනයනය කිරීමේ ව්‍යවසායක් සම්බන්ධයෙන් ද එවැනි ඇඟලුම් අපනයනය කිරීමේ ව්‍යවසායක් සම්බන්ධයෙන් වන විට, ඒ සලාකය නොඉක්මවමින් ඇඟලුම් අපනයනය කිරීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක් ;

(ඉ) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම් නොවන යම් ලාභ සහ ආදායම්

ඊට ඇතුළත් නොවේ.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් ව්‍යවසායක අපනයන ලාභ සහ ආදායම් 20(1) වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් වන්නේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් මේ වගන්තිය අදාළ නොවිය යුතු ය. ' .

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඈඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (i) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(i) (අ) රජය විසින්; සහ

(ආ) යම් රාජ්‍ය සංස්ථාවක් හෝ සංස්ථාගත මණ්ඩලයක් විසින්

ස්වකීය ප්‍රාග්ධනයෙන් සියයට අනූපහකට නොඅඩු මුදලින් හෝ අන්‍යාකාරයකින් දායක වූ ප්‍රාග්ධනය ඇතිව 1983 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සංස්ථාගත කරනු ලැබූ ; '' නවද,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(2) (1) වන උපවගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ සමාගමක ලාභ සහ ආදායම්, 1984 මාර්තු මස 31 වන දිනට ඒ සමාගමේ නිකුත් කළ ප්‍රාග්ධනය මෙන් දෙගුණයකට සමාන මුදලක් වන විට, ඒ උපවගන්තියෙහි සඳහන් නිදහස් කිරීම අවසන් විය යුතු ය.''.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ග) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ච) යම් තැනැත්තකුගේ සේවා නියුක්තයකුට හෝ ඒ සේවානියුක්තයාගේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට, දරුවකුට හෝ මව්පියන්ගෙන් කෙනකුට යම් වාසස්ථානයක් සැලසීමෙහි ලා, 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, 4 වන වගන්තියේ අර්ථානුකූලව ඒ සේවානියුක්තයාගේ සේවා- නියුක්තියෙන් ලබන ලාභවල ඇතුළත් වන්නා වූ ඒ වාසස්ථානයේ කුලී වටිනාකම ඉක්මවන අවස්ථාවක, එසේ දරන ලද වියදමේ අතිරික්තයෙන් දෙකෙන් එක් කොටසක් ; සහ

(ජ) 1984 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ඒ තැනැත්තා විසින් ඇති කරගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් වාහනයක්, පිරියතක්, යන්ත්‍රයක්, සවිකිරීමක් හෝ උපකරණයක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් යම් වර්ෂයකදී ගෙවන ලද කුලිය ඒ ගිවිසුම යටතේ ගෙවිය යුතු සම්පූර්ණ කුලියෙන් හතරෙන් එකකට සමාන මුදලකට වඩා වැඩි වේ නම් එසේ වැඩිවන කුලී ප්‍රමාණය.''.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(2) (අ) (i) යම් තැනැත්තකුගේ සේවයෙහි නියුක්ත විධායක නිලධරයකු නොවන නිලධරයකු විසින් තත් කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන මෝටර් බයිසිකලයක් හෝ බයිසිකලයක් ; සහ

(ii) යම් තැනැත්තකුගේ සේවා නියුක්තයන් ඔවුන් වැඩ කරන ස්ථානයට සහ වැඩ කරන ස්ථානයේ සිට ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන මෝටර් කෝච් රථයක්

සම්බන්ධයෙන් හැර, තම වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ කාර්යය සඳහා ගමන් කිරීම පිණිස පාවිච්චි කරනු ලබන යම් වාහනයක් සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා ; සහ

(ආ) යම් තැනැත්තකුගේ නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ වාසස්ථාන- යෙහි ඒ නිලධරයාගේ හෝ සේවානියුක්තයාගේ ප්‍රයෝජනය සඳහා සලසනු ලැබූ යම් පිරියතක්, යන්ත්‍රයක්, සවිකිරීම්, උපකරණ හෝ දේවල් සම්බන්ධ- යෙන් 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා

වැහැරීම සහ ගෙවීයාම නිසා ක්ෂයවීම සඳහා හෝ එය අලුත් කිරීම සඳහා යම් මුදලකට හෝ 23 (1) (අ) හෝ 23 (1) (ඉ) හෝ 23 (1) (ඊ) වගන්තිය යටතේ යම් දීමනාවකට හෝ (අ) සහ (ආ) ඡේදවල සඳහන් එවැනි යම් වාහන, පිරියත, යන්ත්‍ර, සවිකිරීම්, උපකරණ හෝ දේවල් සම්බන්ධයෙන් යම් කුලියක් හෝ වාර්ෂික ගෙවීමක් සඳහා යම් අඩු කිරීමකට යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නා වූ හෝ යම් වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන්නා වූ කිසිම තැනැත්තකුට හිමිකම නොතිබිය යුතු ය.''.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි ''16අ වගන්තිය, හෝ 22අ වගන්තිය'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''16අ වගන්තිය හෝ 17අ වගන්තිය හෝ 22අ වගන්තිය'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (4අ) උපවගන්තියේ ''20 වන වගන්තියේ'' යන වචන සහ ඉලක්කම් යෙදෙන කවර හෝ තැනක ඒ වචන සහ ඉලක්කම් වෙනුවට ''20 වන වගන්තියේ හෝ 20අ වගන්තියේ'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂ හතරේ එක් එක් තක්සේරු වර්ෂය සඳහා රුපියල් දොළොස් දහසක දීමනාවක් ; '' සහ

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(අඅ) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් දහඅට දහසක දීමනාවක් ;'' සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(අ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(ආ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂ හතරේ එක් එක් වර්ෂය සඳහා රුපියල් දොළොස් දහසක දීමනාවක් ; '' ; සහ

(ආ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ඇ) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් දහඅට දහසක දීමනාවක්.''.

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(අ) ඒ උපවගන්තියේ (ඌ) ඡේදයෙහි "ගෙවන ලද යම් වාර මුදලක්" යන වචන වෙනුවට "1983 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවන ලද යම් වාර මුදලක් ;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඌඌ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඌඌඌ) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා —

(අ) 1957 ජූලි මස 4 වන දිනට පසු ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කරන ලද යම් ඔප්පුවක් සම්බන්ධයෙන්, හෝ

(ආ) 1957 ජූලි මස 4 වන දිනට පසු ශ්‍රී ලංකාවෙන් පිටත දී වාර්ෂිකයක් මිළ දී ගැනීම මත ශ්‍රී ලංකාවෙන් පිටතදී ගෙවන ලද වාර මුදලක් නොවන—

(i) වාර්ෂික වාර මුදල යටත් පිරිසෙයින් අවුරුදු පහක කාලයක් මුළුල්ලෙහි ගෙවිය යුතු (හුදෙක් පරිත්‍යාග රක්ෂණ ඔප්පුවක් නොවන) ජීවිත රක්ෂණ ඔප්පුවක් මත ;

(ii) වාර්ෂික වාර මුදල යටත් පිරිසෙයින් අවුරුදු පහක කාලයක් මුළුල්ලෙහි ගෙවිය යුතු වාර්ෂිකයක් මිළ දී ගැනීම සඳහා ;

(iii) වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් සඳහා

ගෙවීමට උපචිතව ඇති වාර මුදලක් වන යම් වාර මුදලක් ;".

(ඇ) ඒ උපවගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ච) 1983 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

(අ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මතය අනුව ප්‍රමාණවත් පහසුකම් ශ්‍රී ලංකාවෙහි ලබා ගැනීමට නොමැති උපාධි අපේක්ෂක අධ්‍යාපනය හෝ පුහුණුවීමේ පාඨමාලාවක් ; හෝ

(ආ) විශ්ව විද්‍යාලයක හෝ පශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ වෙනත් අධ්‍යාපන ආයතනයක පශ්චාත් උපාධි අධ්‍යාපනය ;

වන යම් අධ්‍යාපනයක් සඳහා වයස අවුරුදු විසිපහකට අඩු අවිවාහක දරුවකුගේ ශ්‍රී ලංකාවෙන් පිටත අධ්‍යාපනය සම්බන්ධයෙන් පුද්ගලයකු විසින් වියදම් කරන ලද යම් මුදලක් ;".

(2) ඒ වගන්තියේ(7) වන උපවගන්තියෙහි '' (ආ) ඡේදයෙහි'' යන වචන වෙනුවට ''(ආ) සහ (ක) ඡේදවල '' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියෙන් කරන ලද සංශෝධනය, 1980 ජූනි මස 24 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි—

(අ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයෙහි ''1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්'' යන යෙදුම වෙනුවට ''1980 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂ තුන සම්බන්ධයෙන්'' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(iii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඅ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ;''.

(2) (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

''එසේ වුවද 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසිකයකු ලෙස සලකනු ලබන පුද්ගලයකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම

(i) 1980 අප්‍රේල් මස 1 වන දින ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂ තුන සම්බන්ධයෙන් රුපියල් දොළොස් දහස ; සහ

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් දහ අට දහස

ඉක්මවන මුදලට නොවැඩි විය යුතු ය.''.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයේ ''1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා'' යන යෙදුම වෙනුවට ''1980 අප්‍රේල් මස 1 වන දින ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂ තුනෙහි එක් එක් වර්ෂය සඳහා'' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි ''නිල ලැයිස්තුගත සමාගමක් නොවන සමාගමක'' යන වචන වෙනුවට ''සමාගමක'' යන වචනය ආදේශ කිරීමෙන්.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(ඇ) ඒ ලාභාංශය, 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එහෙත් 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙර, නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් ප්‍රකාශයට පත් කරන ලද ලාභාංශයක් වන්නා වූ ; හෝ ''

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (ඇ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(ඇ) අදාළ ලාභාංශය නිල ලැයිස්තුගත පොදු සමාගමකින් වාසික සමාගමකට ලැබෙන ලාභාංශයක මුදල් ප්‍රමාණයෙන් 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1984 මාර්තු මස 31 වන දිනට පෙරාතුව ගෙවනු ලබන්නේ නම්, ඒ අදාළ ලාභාංශයේ මුදල් ප්‍රමාණයෙන් සියයට පහකට සමාන ආදායම් බද්දක්.''.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) ''නිල ලැයිස්තුගත පොදු සමාගමක් නොවන සෑම වාසික සමාගමකටම'' යන වචන වෙනුවට ''සෑම වාසික සමාගමකට ම'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ)'' බද්දක් අඩුකර ගැනීමට හිමිකම තිබිය යුතුය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

''බද්දක් අඩුකර ගැනීමට හිමිකම තිබිය යුතුය :

එසේ වුව ද 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් ලාභාංශයකට මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් කිසිවක් අදාළ නොවිය යුතුය ; '' තවද

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ඇ) ඡේදයෙහි ''නිල ලැයිස්තුගත පොදු සමාගමකින් ලැබුණු යම් ලාභාංශයක මුදල සම්බන්ධයෙන්'' යන වචන වෙනුවට ''1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව නිල ලැයිස්තුගත පොදු සමාගමකින් ලැබුණු යම් ලාභාංශයක මුදල සම්බන්ධයෙන්'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

''ධන බද්ද අය කිරීම.

41. මේ පරිච්ඡේදයේ අනෙක් විධිවිධානවලට යටත්ව—

(අ) සෑම තැනැත්තකුගේ, තක්සේරු වර්ෂයේ පළමුවන දිනයේ දී බදු අය කළ හැකි ධනය සම්බන්ධයෙන්, 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරේ එක් එක් වර්ෂය සඳහා ; සහ

(ආ) සෑම තැනැත්තකුගේ, තක්සේරු වර්ෂයේ අවසාන දිනයේදී බදු අය කළ හැකි ධනය සම්බන්ධයෙන්, 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා

මේ පනතේ හතරවන උපලේඛනයෙහි දක්වෙන උචිත අනුප්‍රමාණ අනුව, (මෙහි මින් මතු ''ධන බද්ද'' යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක් අය කළ යුතු ය.''.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (න) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(න) ඒ තක්සේරු වර්ෂය, 10 වන වගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් යම් ගිණුමක තැන්පත් කර ඇති මුදල්වලින් ඒ තැනැත්තාට උපචිත වන පොලිය ඒ ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් වන, තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, ඒ ගිණුමෙහි තැන්පත් කරන ලද මුදල්වලින් සහ ඒ මුදල් මත උපචිත වන පොලියෙන් සමන්විත, ඒ ගිණුමෙහි ඔහුගේ බැරට ඇති මුදල්.''.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(ඊ) තක්සේරු වර්ෂය තුළදී එක් ත්‍යාගයක් පිරිනමනු ලැබුවේ නම් ඒ ත්‍යාගයේ වටිනාකම හෝ එක් ත්‍යාගයකට වැඩි ගණනක් පිරිනමනු ලැබුවේ නම්, ඒ ත්‍යාගවල වටිනාකමේ එකතුව—

(i) 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයේ දී හෝ ඉන් පසුව එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් යම් තක්සේරු වර්ෂයක දී පිරිනමන ලද ත්‍යාගයක් හෝ ත්‍යාග සම්බන්ධයෙන් වන විට රුපියල් දෙදහසක් නොඉක්මවන ත්‍යාගයකට ; සහ

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී පිරිනමන ලද ත්‍යාගයක් හෝ ත්‍යාග සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහසක් නොඉක්මවන ත්‍යාගයකට ;''.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1අ) උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(1අ) 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසිකයකු ලෙස සලකනු ලබන යම් පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදායම, ශ්‍රී ලංකාවේ දී ඉටු කරන ලද සේවාවන්ගෙන් ලැබුණු ආදායමෙන් පමණක් සමන්විත වන්නා වූ සහ —

(i) 1980 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂ තුන සම්බන්ධයෙන් රුපියල් දොළොස් දහසක් ; සහ

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් දහ අට දහසක්

නොඉක්මවන්නා වූ අවස්ථාවක, ඒ ආදායම සම්බන්ධයෙන් බදු අය කරනු නොලැබිය යුතු ය.''.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ (5) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි ''කරන ලෙස නියම කෙරෙන'' යන වචන වෙනුවට ''කරන ලෙස නියම කෙරෙන ; හෝ '' යන වචන ආදේශ කිරීමෙන් සහ ඒ වගන්තියට අගට යෙදෙන '' ලිඛිත දැන්වීමක් කළ හැකිය'' යන වචන ඉවත් කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

'(ඇ) දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත, ඒ තැනැත්තා සහ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පංතියක් අතර ඇති යම් ගනුදෙනු වලට අදාළව ඒ දැන්වීම මගින් ඉල්ලනු ලබන යම් තොරතුරක් සැපයීමට නියම කෙරෙන

ලිඛිත දැන්වීමක් කළ හැකි ය.

යම් තොරතුරක් සැපයීමට යම් තැනැත්තකුට නියම කරමින් මේ උපවගන්තිය යටතේ ඒ තැනැත්තාට දැන්වීමක් දෙනු ලැබ ඇති අවස්ථාවක, ඒ තොරතුරු සැපයීම තහනම් කරමින් වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ තැනැත්තා විසින් ඒ දැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

සැක දුරු කිරීම සඳහා මේ උපවගන්තියෙහි ''යම් තැනැත්තකු'' සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම්වල බැංකුකරුවකු සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ඇතුළත් වන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.'.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 92අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

'හවුල් කරුවන් ආදීන් විසින් විගණක වාර්තා සැපයිය යුතු බව.

92අ. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා ගිණුම් ප්‍රකාශයක් සහ ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කරනු ලබන්නේ යම් කාලයක් සම්බන්ධයෙන් ද ඒ කාලය සඳහා යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පිළිබඳව, දැන්වීමෙහි සඳහන් කරනු ලබන විස්තර ඇතුළත් යම් උපලේඛන සැපයීමට නියම කරමින් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකුට හෝ ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ තක්සේරුකරුවකු විසින් ලිඛිත දැන්වීමක් කරනු ලැබිය හැකිය.

(2) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු විසින් සපයනු ලබන ආදායම පිළිබඳ වාර වාර්තාවක් සනාථ කිරීමෙහි ලා වූ ගිණුම් ප්‍රකාශය, අනුමත ගණකාධිකාරීවරයකු විසින් සකස් කොට ඇති අවස්ථාවක, ඒ ප්‍රකාශය සමග—

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ආකාරයකින් සහ විස්තර ඇතුළත් කරමින්, අනුමත ගණකාධිකාරිවරයකුගේ සහතිකයක් ; සහ

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන, ගිණුම් ප්‍රකාශයට අදාළ යම් විස්තර ඇතුළත් උපලේඛන

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා " අනුමත ගණකාධිකාරිවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ සාමාජිකයකු වන ගණකාධිකාරිවරයෙක් ;

(ආ) " බලයලත් නියෝජිතයා" යන්නෙහි අර්ථකථනයේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ගණකාධිකාරිවරයෙක් ; සහ

(ඇ) සමාගම් (විගණකවරයන්) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබ, "බලයලත් නියෝජිතයා" යන්නෙහි අර්ථකථනයේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් පුද්ගලයෙක්

අදහස් වේ.'.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "රුපියල් එක්දහසක්" යන වචන වෙනුවට "රුපියල් පන්දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පැහැර හරින්නා වෙත දැන්වීම"

128. (1) පැහැර හැර ඇති යම් බද්දක් මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති යම් ආකාරයකින් අයකර ගැනීමට කටයුතු කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව—

(අ) ඒ බද්ද පිළිබඳ විස්තර, සහ

(ආ) ඒ බද්ද අයකර ගැනීම සඳහා කටයුතු කිරීමට අදහස් කරන බව සඳහන් කරමින් පැහැර හරින්නා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(2) පැහැර හැර ඇති යම් බද්දක් අයකර ගැනීම සඳහා (1) වන උපවගන්තියේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව ක්‍රියා කිරීම අවස්ථානුකූල නොවන බවට සහ ඒ බද්ද අයකරගැනීම සඳහා වහාම කටයුතු කිරීම අවශ්‍ය බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ උපවගන්තියෙන් නියමිත පරිදි, පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් නොකොට, ඒ බද්ද අයකර ගැනීමට ඔහු විසින් කටයුතු කරනු ලැබිය හැකි ය. පැහැර හැර ඇති යම් බද්දක් අයකර ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ උපවගන්තිය යටතේ කටයුතු කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ කටයුතු කිරීමේ දින සිට දින දහහතරක් ඇතුළත, කටයුතු කරනු ලැබ ඇත්තේ යම් බද්දක් සම්බන්ධයෙන් ද ඒ බද්ද පිළිබඳ විස්තර සහ ඒ කටයුතුවල ස්වභාවය සඳහන් කෙරෙන දැන්වීමක් පැහැර හරින්නා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) ඒ බද්ද අය කරනු ලබන්නේ යම් තක්සේරුවක් හෝ තක්සේරු සම්බන්ධයෙන් ද ඒ තක්සේරුවට හෝ තක්සේරුවලට විරුද්ධව නියි කාලසීමාව ඇතුළත පැහැර හරින්නා විසින් අභියාචනයක් ඉදිරිපත්කොට නොමැති නම්, (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ දැන්වීම නිකුත් කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත, එසේ අය කරන ලද බද්ද සම්බන්ධයෙන් ඔහු විසින් යම් විරෝධතාවක් ඉදිරිපත් කළ හැකි ය. තවද, 123 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ විරෝධතාව සැළකිල්ලට භාජනය කොට ඒ විරෝධතාව පිළිබඳව ඔහුගේ තීරණය දිය යුතු අතර එය අවසානාත්මක විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ කරන ලද යම් කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් අයකර ගන්නා ලද බද්ද, යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් පැහැර හරින්නා විසින් (3) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බවට නිශ්චය කරනු ලබන බද්දේ ප්‍රමාණය ඉක්මවන අවස්ථාවක, 149 වන වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද ඒ අතිරික්තය පැහැර හරින්නාට ආපසු ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ වූ කිසිම ආපසු ගෙවීමක්, (2) වන උපවගන්තිය යටතේ කරන ලද කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් අයකර ගන්නා ලද බද්ද නොඉක්මවිය යුතු ය.''.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ ''රුපියල් දෙදහසකට'' හෝ ''රුපියල් දෙදහසක්'' යන වචන යෙදෙන කවර හෝ විටක ඒ වචන වෙනුවට ''රුපියල් හත්දහස් පන්සියයකට'' හෝ ''රුපියල් හත්දහස් පන්සියයක්'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ ''රුපියල් පන්දහසක්'' යන වචන යෙදෙන කවර හෝ විටක ඒ වචන වෙනුවට ''රුපියල් දස දහසක්'' යන වචන ආදේශ කිරීමෙන්.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තියේ '' දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයන්'' යන වචන වෙනුවට ''දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයන්, දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ ''තක්සේරුකරු'' යන අර්ථකථනයෙහි ''තක්සේරුකරුවකු අදහස් වේ''; යන වචන වෙනුවට ''තක්සේරුකරුවකු අදහස් වන අතර, දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ද ඊට ඇතුළත් වේ'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) එහි II වන කොටසේ ''1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා'' යන යෙදුම වෙනුවට, ''1980 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂ තුන සඳහා '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ii) එහි II වන කොටසට ඉක්බිතිවම, පහත දක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

II අ කොටස

1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දේ අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

බදු අයකළ හැකි ආදායමෙහි පළමුවන රු. 6,000 සම්බන්ධයෙන් සියයට $7\frac{1}{2}$
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 6,000 සම්බන්ධයෙන් සියයට 10
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 6,000 සම්බන්ධයෙන් සියයට 15
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 6,000 සම්බන්ධයෙන් සියයට 20
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 6,000 සම්බන්ධයෙන් සියයට 25
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 6,000 සම්බන්ධයෙන් සියයට 30
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 6,000 සම්බන්ධයෙන් සියයට 35
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 6,000 සම්බන්ධයෙන් සියයට 40
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් සියයට 45
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් සියයට 50
බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් සියයට 55.".

31. මේ පනතේ 4 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට කරන ලද සංශෝධනය සහ මේ පනතේ 20 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියට කරන ලද සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

## 1984 අංක 19 දරන මුදල් (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1984 මැයි මස 02 වන දින]**

**1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1984 අංක 19 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 16 දරන පනතින් සංශෝධිත, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(අ) (අ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අඅ) (i) ඒ ස්ථානයේ මුල් අයිතිකරුට විරුද්ධව අධිකරණයක් විසින් සටහන් කරන ලද උකස් නඩු තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීමෙහිලා ඒ ස්ථානය විකුණනු ලැබූ දින සිට ; හෝ

(ii) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි සඳහන් යම් අවස්ථාවක දී, ඒ ස්ථානයේ මුල් අයිතිකරු විසින් ඒ ස්ථානය පවරනු ලැබූ දින සිට ; හෝ

(iii) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි නිශ්චිත කාලය අවසන් වන දින සිට ; හෝ

අවුරුදු දහයක කාලයක් ඇතුළත දී ඒ ඉල්ලීම කරනු ලබන්නේ නම් මිස."

(ආ) (ආ) ඡේදය අත් හැරීමෙන් ; සහ

(ඇ) (ඇ) ඡේදයෙහි ''රුපියල් දහදාහකට'' යන වචන වෙනුවට ''රුපියල් විසිපන්දහසකට'' යන වචන ආදේශ කිරීමෙන්

ඒ වගන්තිය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**3.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (3) වන උපවගන්තිය අගට පහත දක්වෙන කොටස එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

''සැක ඉවත් කිරීම සඳහා 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතින් සහ 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනතින් යම් ස්ථානයක කුලී නිවැසියා වෙත පවරා දෙන ලද යම් අයිතිවාසිකමක්, මේ උපවගන්තියේ අර්ථානුකූල වූ බැඳීමක් බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.''.

**4.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

''බැංකුව වෙත සතු කරන ලද ස්ථානයක් සම්බන්ධයෙන් මේ පනතේ මේ කොටස යටතේ වන්දිය

76. (1) බැංකුව වෙත සතු කරන ලද යම් ස්ථානයක් සම්බන්ධයෙන් මේ පනතේ මේ කොටස යටතේ ගෙවිය යුතු වන්දි ප්‍රමාණය—

(අ) ඒ ස්ථානය සම්බන්ධයෙන් වූ සතු කිරීමේ නියමය පළ කිරීමට පෙරාතුව, එහි අයිතිකරුව සිටි තැනැත්තා විසින් ඒ ස්ථානය මිලදී ගැනීමෙන් අත්කර ගනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ ස්ථානය මිලට ගනු ලැබුවේ යම් මුදල් ප්‍රමාණයකට ද ඒ මුදල් ප්‍රමාණය හා වන්දි විනිශ්චයාධිකාරය විසින් ඒ මුදල් ප්‍රමාණය වෙනුවෙන් තීරණය කරනු ලැබූ පොලිය සහ ඒ ස්ථානය සම්බන්ධ සතු කිරීමේ නියමය පළ කිරීමට පෙර ඒ ස්ථානය විෂයයෙහි සම්බන්ධතාවක් තිබූ යම් තැනැත්තකු විසින් ඒ ස්ථානයට කරන ලද යම් තදනන්තර එකතු කිරීම් වල සහ වැඩි දියුණු කිරීම්වල යුක්ති සහගත වටිනාකමට සමාන අතිරේක මුදලක් හෝ ඒ ස්ථානයෙහි වෙළෙඳ වටිනාකම යන දෙක අතරින් අඩු මුදල; හෝ

(ආ) ඒ ස්ථානය සම්බන්ධයෙන් වූ සතු කිරීමේ නියමය පළ කිරීමේ දිනයට පෙරාතුව, එහි අයිතිකරුව සිටි තැනැත්තා විසින් ඒ ස්ථානය ත්‍යාගයක් වශයෙන් හෝ උරුමවීමක් වශයෙන් අත්කර ගනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තාගේ පූර්වගාමී අයිතිකරු විසින් ඒ ස්ථානය මිලට ගනු ලැබුවේ යම් මුදල් ප්‍රමාණයකට ද, ඒ මුදල් ප්‍රමාණය සහ වන්දි විනිශ්චයාධිකාරය විසින් ඒ මුදල් ප්‍රමාණය වෙනුවෙන් තීරණය කරනු ලබන පොලිය සහ ඒ මිලට ගැනීමට අනතුරුව සහ ඒ ස්ථානය සම්බන්ධයෙන් සතු කිරීමේ නියමය පළ කිරීමට පෙර ඒ ස්ථානය විෂයයෙහි සම්බන්ධතාවක් තිබූ යම් තැනැත්තකු විසින් ඒ ස්ථානයට කරන ලද යම් එකතු කිරීම්වල සහ වැඩි දියුණු කිරීම්වල යුක්ති සහගත වටිනාකමට සමාන අතිරේක මුදලක් හෝ ඒ ස්ථානයෙහි වෙළෙඳ වටිනාකම යන දෙක අතරින් අඩු මුදල විය යුතුය.

(2) මේ පනතේ මේ කොටස යටතේ බැංකුව වෙත සතු කරනු ලැබූ යම් ස්ථානයකට 71 වන වගන්තියේ (2අ) වන උපවගන්තිය යටතේ ඒ ස්ථානයේ අයිතිකරු වෙත යවන ලද දැන්වීමේ දිනයෙන් ආරම්භව, ඒ ස්ථානය සම්බන්ධයෙන් වූ සතුකිරීමේ නියමය පළ කිරීමේ දිනයෙන් අවසන්වන කාලසීමාව තුළ යම් අලාභයක් සිදුකරනු ලැබූ අවස්ථාවක,

ඒ අලාභයේ ප්‍රමාණය තක්සේරු කිරීමට ද එසේ තක්සේරු කරන ලද ප්‍රමාණය, ඒ ස්ථානය සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දියෙන් හිලව් කිරීමට ද වන්දි විනිශ්චයාධිකාරයට බලය තිබිය යුතු ය.''.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියට ඉක්බිතිවම , පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

''වන්දි විනිශ්චයාධිකාරයේ රැස්වීම් සම්බන්ධයෙන් මේ පනත යටතේ වැරදි.

85අ. (1) යම් තැනැත්තකු විසින්—

(අ) වන්දි විනිශ්චයාධිකාරයේ යම් රැස්වීමක් පවත්වන කාලය තුළ හෝ එය අවසාන වීමෙන් පසුව, වන්දි විනිශ්චයාධිකාරය හෝ වන්දි විනිශ්චයාධිකාරයේ සාමාජිකයන් හෝ අපකීර්තියට පත් කරන යම් දෙයක් කරනු ලබන ; හෝ

(ආ) වන්දි විනිශ්චයාධිකාරයේ නිත්‍යානුකූල ක්‍රියාවලියට බාධාවක් කරනු-ලබන ; හෝ

(ඇ) වන්දි විනිශ්චයාධිකාරය විසින් මේ පනත යටතේ යම් රැස්වීමක් පවත්වනු ලබන අතරතුර—

(i) වන්දි විනිශ්චයාධිකාරය විසින් නිකුත් කරන ලද යම් සිතාසියක සඳහන් වේලාවට සහ ස්ථානයේ දී, ඒ විනිශ්චයාධිකාරය ඉදිරියේ පෙනී සිටීම, විනිශ්චයාධිකාරයේ මතය අනුව යුක්ති සහගත වන හේතුවක් නොමැතිව, පැහැර හරිනු ලබන ; හෝ

(ii) දිවුරුම්දීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ යථා පරිදි දිවුරුම් දීමෙන් පසුව ඔහු වෙත ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රශ්නයකට වන්දි විනිශ්චයාධිකාරයේ මතය අනුව යුක්ති සහගත වන හේතුවක් නොමැතිව, උත්තර දීම ප්‍රතික්ෂේප කරනු ලබන හෝ පැහැර හරිනු ලබන; හෝ

(iii) තම සන්තකයෙහි හෝ බලයට යටත්ව ඇත්තා වූ ද, මේ පනතේ මේ කොටස යටතේ බැංකුව වෙත සතු කරන ලද යම් ස්ථානයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් වන්දියක ප්‍රමාණය තීරණය කිරීම සඳහා වන්දි විනිශ්චයාධිකාරයේ මතය අනුව අවශ්‍ය වන්නාවූ ද යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඒ විනිශ්චයාධිකාරය වෙත ඉදිරිපත් කිරීම සහ පෙන්වීම, ඒ විනිශ්චයාධිකාරයේ මතය අනුව යුක්ති සහගත වන හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලබන හෝ පැහැර හරිනු ලබන

අවස්ථාවක, ඒ තැනැත්තා වන්දි විනිශ්චයාධිකාරයේ බලයට විරුද්ධව අපහාස කිරීමේ වරදකට හෝ ඒ විනිශ්චයාධිකාරයේ බලය නොතකමින් අපහාස කිරීමේ වරදකට වරදකරු වන්නේ ය.

(2) මෙහි (1) වන උපවගන්තියෙහි සඳහන් පරිදි වන්දි විනිශ්චයාධිකාරයේ බලයට විරුද්ධව අපහාස වරදක් හෝ ඒ විනිශ්චයාධිකාරයේ බලය නොතකමින් අපහාස වරදක් යම් තැනැත්තකු විසින් කරනු ලැබ ඇති බවට වන්දි විනිශ්චයාධිකාරය තීරණය කරනු

ලබන අවස්ථාවක, ඒ තීරණය දැක්වෙන සහතිකයක් විනිශ්චයාධිකාරයේ ලේකම්වරයා විසින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබීමට ඡන්දි විනිශ්චයාධිකාරය විසින් සැලැස්විය හැකි ය ; එවැනි සෑම සහතිකයක් ම ඡන්දි විනිශ්චයාධිකාරයේ සභාපතිවරයා විසින් අත්සන් කළ යුතු ය.

(3) මෙහි පහත (5) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි සංජානනය කිරීමට සුදුසු යයි අභියාචනාධිකරණය අදහස් කරන අපහාස වරදක් පිළිබඳව දඬුවම් කිරීම සඳහා වූ යම් නඩු කටයුත්තක දී (2) වන උපවගන්තිය යටතේ අත්සන් කොට ඒ අධිකරණය වෙත යවනු ලබන සහතිකයක් ලෙස අදහස් කෙරෙන යම් ලේඛනයක්—

(අ) සාක්ෂි වශයෙන් භාරගනු ලැබිය යුතු අතර, පටහැනි කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, වැඩිදුර ඔප්පු කිරීමකින් තොරව ඒ සහතිකය ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) එහි දක්වා ඇති තීරණයෙහි සඳහන් කොට ඇති සිද්ධීන් පිළිබඳව සාක්ෂියක් විය යුතු අතර එම තීරණය ඡන්දි විනිශ්චයාධිකාරය විසින් කරන ලද බවට තීරණාත්මක සාක්ෂිය විය යුතුය.

(4) ඡන්දි විනිශ්චයාධිකාරයේ බලයට විරුද්ධව කරන ලදැයි කියන අපහාස වරදක් හෝ ඒ විනිශ්චයාධිකාරයේ බලය නොතකමින් කරන ලදැයි කියන අපහාස වරදක් පිළිබඳව දඬුවම් කිරීම සඳහා මෙහි පහත (5) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි, පවත්වනු ලබන යම් නඩු කටයුත්තක දී, ඒ විනිශ්චයාධිකාරයේ යම් සාමාජිකයකුගේ කැමැත්ත ඇතිව මිස ඔහුට සිතාසි නිකුත් කරනු ලැබීම හෝ සාක්ෂි කරුවකු වශයෙන් ඔහුගෙන් ප්‍රශ්න කරනු ලැබීම හෝ නොකළ යුතු ය.

(5) ඡන්දි විනිශ්චයාධිකාරයේ බලයට විරුද්ධව කරන ලද සෑම අපහාස වරදක්ම හෝ ඒ විනිශ්චයාධිකාරයේ බලය නොතකමින් කරන ලද සෑම අපහාස වරදක් ම සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් දඬුවම් කළ යුතු ය.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලැබේ :—

"බැංකුවට, 71 වන වගන්තිය යටතේ ඉල්ලුම්කරුට සහ ඡන්දිවලට හිමිකම් පාන්නන්ට කරුණු කියා සිටීමේ අවස්ථාවක් දියයුතු බව.

88. ඡන්දියක් සම්බන්ධයෙන් තීන්දුවක් කිරීම සඳහා ඡන්දි විනිශ්චයාධිකාරය වෙත යම් යොමු කිරීමක් කරනු ලැබූ අවස්ථාවක විනිශ්චයාධිකාරය විසින් තීන්දුවක් කිරීමට පෙර, බැංකුවටද, යොමු කිරීම අදාළ ස්ථානය අත්කර ගැනීම සඳහා 71 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කළ තැනැත්තාට ද, ඡන්දිවලට හිමිකම් පෑමක් කළ සෑම තැනැත්තකුටම ද, තමා විසින් ම හෝ තත් කාර්යය සඳහා බලය දෙන ලද නියෝජිතයකු මගින්, කරුණු කියා සිටීමේ අවස්ථාවක් දිය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2) ගෙවල් කුලී වශයෙන් ලැබිය යුතු යම් අර්ධ වාර්ෂික ගෙවීම් කිරීමෙහි ලා පැහැර හැරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, සම්පූර්ණයෙන් නොගෙවන ලද අර්ධ වාර්ෂික ගෙවීම් සම්බන්ධයෙන් පැහැර හැරීම කරනු ලැබූ ලෙස සැළකිය යුතු අතර, බලය දීමේ දින සිට දින 21 කට නොඅඩු යම් කාලයක දී ඒ ස්ථානය, එසේ සම්පූර්ණයෙන් නොගෙවන ලද සම්පූර්ණ අර්ධ වාර්ෂික ගෙවීම් හා ඒ වෙනුවෙන් වූ පොලිය සමග නොගෙවන ලද සම්පූර්ණ අර්ධ වාර්ෂික ගෙවීම් සහ විකිණීම ප්‍රචාරය කිරීමේ වියදම් සහ ස්ථානය විකිණීම සම්බන්ධයෙන් වූ වෙනත් ආනුෂංගික වියදම් ලබා ගැනීම පිණිස විකිණීමට බැංකුවේ සභාපතිවරයා විසින් යම් තැනැත්තකුට ලියවිල්ලකින් බලය දිය හැකි ය.

(3) යම් ස්ථානයක් (2) වන උපවගන්තිය යටතේ බලය දීමක් අනුව විකුණනු ලැබූ අවස්ථාවක, බැංකුවේ සභාපති වරයා විසින් විකිණීම පිළිබඳ සහතිකයක් අත්සන් කොට ගැනුම්කරුට නිකුත් කළ යුතු අතර, එවිට ස්ථානය සම්බන්ධයෙන් අයිතිකරුගේ නිත්‍යානුකූල අයිතිය ගැනුම්කරුවා සතු විය යුතුය. තවද, බැංකුව විසින් අත්තිකාරම් වශයෙන් දෙන ලද සියලු මුදල් සහ ඒ වෙනුවෙන් වූ පොලිය සහ ලබා ගත යුතු වෙනත් වියදම් විකිණීමෙන් ලත් මුදලින් අඩුකරගැනීමෙන් පසුව, යම් ඉතිරියක් වෙතොත් සභාපතිවරයා විසින් එය බොල් ණය සහ සැක සහිත ණය වෙනුවෙන් අවිනිශ්චිත අරමුදලට බැරකරනු ලැබීමට ඉන් සියයට දහයක් අඩුකොට ගෙන ඉල්ලුම්කරුට ගෙවිය යුතුය.

(4) (2) වන උපවගන්තිය යටතේ වූ බලය දීමක් අනුව විකුණන ලද යම් ස්ථානයක ගැනුම්කරු විසින්, ඒ ස්ථානය පිහිටා තිබෙන ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයට ඉල්ලීමක් කරනු ලැබූ විට සහ (3) වන උපවගන්තිය යටතේ ඒ ස්ථානය සම්බන්ධයෙන් නිකුත් කරන ලද විකුණුම් සහතිකය ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ ස්ථානයේ සන්තකය භාරදීම සඳහා ආඥාවක් ලබා ගැනීමට ඔහුට අයිතිවාසිකම් ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ලඝු කාර්ය පරිපාටිය අනුව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ ගැන එලෙසම සුදුස්සක් කරනු ලැබිය යුතු ය. ".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

(අ) "ව්‍යාපාර ස්ථානය" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' "ව්‍යාපාර ස්ථානය" යන්නෙන් ව්‍යාපාරයක කාර්යය සඳහා සම්පූර්ණ වශයෙන් සහ ප්‍රධාන වශයෙන් පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක් අදහස් වේ ; ' තවද

(ආ) "සම්බන්ධතාවක් ඇති තැනැත්තා" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම පහත දක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' "ස්ථානය" යන්නෙන් ගොඩනැගිලි සහිත හෝ රහිත යම් ඉඩමක් අදහස් වේ.'.

# 1984 අංක 29 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 27 වන දින]

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1984 අංක 29 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ''පස්දෙනකුගෙන්'' යන වචන වෙනුවට ''නවදෙනකුගෙන්''යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ''එසේ පත් කරනු ලබන තැනැත්තන් අතුරින්'' යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

''එසේ පත් කරනු ලබන තැනැත්තන් අතුරින් තිදෙනකු—

(අ) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ;

(ආ) නිවාස විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ;

(ඇ) පශු සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ එක් එක් නියෝජිතයකු බැගින් වනසේ පත් කරනු ලැබිය යුතු ය.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි (i) වන සහ (ii) වන අනුඡේදවල දැක්වෙන ''යම් කෘෂිකාර්මික හෝ කාර්මික කාර්යයක් සඳහා'' යන වචන වෙනුවට ඒ එක් එක් අනුඡේදයෙහි ''යම් නිවාස, කෘෂිකාර්මික හෝ කාර්මික කාර්යයක් සඳහා '' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියෙහි (ඇ) ඡේදයෙහි ''කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධනය'' යන වචන වෙනුවට '' නිවාස, කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධනය'' යන වචන සහ (ඈ) ඡේදයෙහි ''කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තවල'' යන වචන වෙනුවට ''නිවාස කටයුතුවල, කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තවල'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියෙහි (ඉ) සහ (ඊ) ඡේදවල ''කෘෂිකාර්මික හෝ කාර්මික'' යන වචන වෙනුවට ඒ එක් එක් ඡේදයෙහි ''නිවාස, කෘෂිකාර්මික හෝ කාර්මික'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (උ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(උ) ආණ්ඩුව විසින් හෝ මහ බැංකුව විසින් හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් බැංකුවක් හෝ ආයතනයක් විසින් හෝ නිකුත් කරනු ලැබූ නැතහොත් සහතික කරනු ලැබූ ස්කන්ධ, කොටස්, ණය පත්‍ර, උකස්, බැඳුම්කර හෝ සුරැකුම්පත් මිල දී ගැනීම, විකිණීම, ඒවායෙහි ආයෝජනය කිරීම හෝ ඒවා පිළිබඳව කටයුතු කිරීම; " ;

(ඉ) ඒ උපවගන්තියේ (ච) ඡේදයෙහි "වාරික තැන්පතු" යන වචන වෙනුවට "වාරික තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු, ගිවිසුම් තැන්පතු සහ ණය සම්බන්ධිත ඉතිරි කිරීමේ තැන්පතු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) ඒ උපවගන්තියෙහි (ජ) ඡේදයෙහි "කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තයන්හි" යන වචන වෙනුවට "නිවාස කටයුතුවල, කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තයන්හි " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(උ) ඒ උපවගන්තියෙහි (අආ) යන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ආආ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් බැංකුවකින් හෝ වෙනත් ආයතනයකින් පිරිනමන ලද ණය සඳහා නැවත මුදල් සැපයීම.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් විසි කෝටියක්" යන වචන වෙනුවට "රුපියල් දෙසිය කෝටියක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "මණ්ඩලය විසින් විකිණීමේ සහතිකයක් අත්සන් කළ යුතු අතර" යන වචන වෙනුවට "මණ්ඩලය වෙනුවෙන් මණ්ඩලයෙහි කිසියම් සාමාජිකයන් දෙදෙනකු විසින් විකිණීමේ සහතිකයක් අත්සන් කළ යුතු අතර" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින්" යන වචන වෙනුවට "(1) වන උප වගන්තිය යටතේ"යන වචන ආදේශ කිරීමෙන්.

## 1984 අංක 33 දරන විදේශීය ණය (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1984 අගෝස්තු මස 23 වන දින]**

**1957 අංක 29 දරන විදේශීය ණය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1984 අංක 33 දරන විදේශීය ණය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 1980 අංක 23 දරන පනතින් ප්‍රතියෝජනය කරන ලද 1957 අංක 29 දරන විදේශීය ණය පනතේ 5 වන වගන්තියේ "විදේශීය ණය" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"විදේශීය ණය" යන්නෙන්—

(අ) විදේශීය ආණ්ඩුවක් විසින් හෝ විදේශීය ආණ්ඩුවක නියෝජ්‍යායතනයක් විසින්; හෝ

(ආ) යම් ජාත්‍යන්තර සංවිධානයක් විසින් ; හෝ

(ඇ) පොදුවේ හෝ යම් විශේෂ ගනුදෙනුවක් සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන නැතහොත් ගනුදෙනුවේ ස්වභාවය සැලකිල්ලට ගෙන අදාළ තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ අනන්‍යතාව කඩිනමින් නිශ්වය කළ නොහැකි බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන, ශ්‍රී ලංකාවෙන් පිටත වූ සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත නොකරනු ලැබූ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්

ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ පොදු ව්‍යවසායකට හෝ කවර වූ හෝ ව්‍යවහාර මුදලකින් ප්‍රදානය කරනු ලබන ණයක් හෝ කවර වූ හෝ ආකාරයක මූල්‍ය බැර කිරීමක් හෝ ණය දීමක් අදහස් කෙරෙන අතර,

(i) අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, රාජ්‍ය සංස්ථාවක් හෝ පොදු ව්‍යවසායක් සහ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු අතර වූ යම් ගණුදෙනුවක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ හෝ ඒ රාජ්‍ය සංස්ථාවේ හෝ පොදු ව්‍යවසායේ හෝ යම් බැඳීමක් නිදහස් කරන්නා වූ යම් විදේශීය ආණ්ඩුවකට, නියෝජ්‍යායතනයකට, සංවිධානයකට, තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට ගෙවීමට, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ ඒ රාජ්‍ය සංස්ථාව හෝ පොදු ව්‍යවසාය පොරොන්දු වන යම් මුදල් ප්‍රමාණයක් ; සහ

(ii) පොදුවේ හෝ විශේෂ ගණුදෙනුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන නැතහොත් ගණුදෙනුවේ ස්වභාවය සැලකිල්ලට ගෙන, අදාළ තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ අනන්‍යතාව කඩිනමින් නිශ්වය කර ගත නොහැකි බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ශ්‍රී ලංකාව ඇතුළත වූ සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත නොකරනු ලැබූ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ පොදු ව්‍යවසායකට ශ්‍රී ලංකා රුපියල හැර වෙනත් කවර වූ හෝ ව්‍යවහාර මුදලකින් ප්‍රදානය කරනු ලබන ණයක් හෝ කවර වූ හෝ ආකාරයක මූල්‍ය බැර කිරීමක් හෝ ණයදීමක්

ඊට ඇතුළත් වේ.'.

## 1984 අංක 46 දරන විසර්ජන පනත

**[සහතිකය සටහන් කළේ 1984 දෙසැම්බර් මස 28 වන දින]**

**1985 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1984 අංක 46 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නාවූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි ''1985 මුදල් වර්ෂය'' යනුවෙන් සඳහන් කරනු ලබන 1985 ජනවාරි මස 1 වන

දිනයෙන් ආරම්භව 1985 දෙසැම්බර් 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරුකර ඇති රුපියල් හාරදහස් පන්සිය තිස්හතර කෝටි තිස්තුන් ලක්ෂ තිස් දෙදහසක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් ; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් දෙදහස් දෙසිය පනස් තුන් කෝටි අනූ ලක්ෂයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින්

පියවිය යුතු ය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් හාරදහස් පන්සිය තිස් හතර කෝටි තිස්තුන් ලක්ෂ තිස් දෙදහසක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන් කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතු ය.

3. (1) 198 මුදල් වර්ෂය තුළ දී, මෙම පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනෙහි දක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම් එය 1985 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිගමනය කිරීමේ කාර්යය සඳහා පහත දක්වෙන ගෙවීම්, එනම් :—

(අ) කිසියම් කටයුත්තක ආදායමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපල වෙනුවෙන් ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන

එක් එක් කටයුත්තක ආදායමින් අඩු කළ යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1985 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම්, ඒ මුදල් වර්ෂය තුළදී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 1985 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තවද, ඒ මුදල් වර්ෂයේ අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම්, එම උපලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

**4.** 1985 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි හෝ වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකි ය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

**5.** (1) යථෝක්ත උපලේඛනයේ සඳහන් කිසියම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම්කිසි වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට මේ පනතේ පළමුවන උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්දාවූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද, යම් මුදලක් එම වැඩ සටහනේම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේ ම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

**6.** (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩුවිය හැකි බවට ; හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමකට පත් වූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ඉවත් කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

**7.** අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව—

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දැක්වෙන උපරිම සීමා කිසිවක් ;

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයේ දැක්වෙන අවම සීමා

නියමයක් මගින් 1986 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර හෝ වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

එවැනි කිසියම් නියමයක්, එහි එසේ ප්‍රකාශිතව සඳහන් කරනු ලැබුවහොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් වූ සහ එහි දක්වනු ලබන දිනයක සිට බලපැවැත්වූ ලෙස සැලකිය යුතු ය.

**8.** පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ—

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් ;

(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව

එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.

## 1984 අංක 47 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1984 දෙසැම්බර් මස 28 වන දින]**

**1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1984 අංක 47 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (1) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(1) ඒ ද්‍රව්‍ය ආනයනය කරන ලද අවස්ථාවක—

(අ) තීරුබදු ආඥාපනත අනුව, තීරු බද්දේ කාර්යය සඳහා නිශ්චය කරන ලද ඒ ද්‍රව්‍යවල වටිනාකමෙහි ; සහ

(ආ) ඒ ද්‍රව්‍ය වෙනුවෙන් යම් තීරු බද්දක් ගෙවන ලද්දේ නම්, ඒ තීරු බදු ප්‍රමාණයෙහි

එකතුව සියයට දහයකින් වැඩි කළ ප්‍රමාණය ඇතුළත් වේ.''.

**3.** 1983 අංක 39 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ අතුරු වගන්තියෙහි ''එක් කෝටි පණස් ලක්ෂය'' යන වචන වෙනුවට ''පණස් ලක්ෂය'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4.** මේ පනතේ 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 1984 නොවැම්බර් මස 14 වන දින මධ්‍යම රාත්‍රියෙහි සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. ඒ අනුව මේ පනතේ 2 වන වගන්තිය මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට අනුව ආනයනකරුවකුගෙන් 1984 නොවැම්බර් මස 14 වන දින මධ්‍යම රාත්‍රියෙන් ආරම්භව, මේ පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ අය කර ගන්නා ලද යම් බද්දක්, වලංගු ලෙස පනවා අය කරගනු ලැබූ ලෙස හා එසේ අය කරගනුලබන ලෙස සලකනු ලැබිය යුතු ය.